**මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහය - 2022**

---

**1. විගණන මතය**

1.1 මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහයෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 10 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 04 ක කන්න ගොවිතැන් සඳහා කාබනික පොහොර බෑමේ කුලී ලෙස එකතුව රු.1,960,529 ක් පොහොර සමාගම් තුනකින් අයවිය යුතුව තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවන අවස්ථාවන් පහත දැක්වේ.

| නීති රිති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති 01/2020 අංක දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටස 9.1 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 8 ක් විසින් මුදල්, චෙක්පත් සහ ගබඩා භාර නිලධාරීගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ විස්තර කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. | නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 10 ක මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.8,960,425 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.27,586,615 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,626,190 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවය

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තුනුක්කායි ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවි සංවිධානවලට ගෙවිය යුතු යල කන්නයේ දඩ මුදල්වල එකතුව රු. 595,950 ක් නිරවුල් කර නොතිබුණි. | නිසි පරිදි ගෙවන ලෙස දැනුවත් කර ඇත. | නිරවුල් කිරීමට කටයුතු කර යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක බදු පදනම මත ලබා දුන් ට්‍රැක්ටර් රථ සඳහා හිඟ බදු කුලී එකතුව රු. 1,721,050 ක් ඉකුත් වර්ෂ 04 ක සිට 10 දක්වා කාලයක සිට අයකර ගැනීමට හෝ බදුකරුවන්ගෙන් ට්‍රැක්ටර් රථ අත්පත්කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ට්‍රැක්ටර් රථ නැවත ලබා ගන්නා ලෙස සියළු ගොවිජන සේවා මධ්‍යස්ථානයන් වෙත දැනුවත් කර ඇත. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 කින් අයවිය යුතු රු. 2,017,950 ක් සහ ගෙවිය යුතු රු. 3,716,995 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණද, වර්ෂ 10 ක් ගතවී ඇතත්, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 2022.06.01 දිනැති අංක 7/05/12/11 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක මධ්‍යස්ථානවල ප්‍රයෝජනයට ගනු ලැබූ ට්‍රැක්ටර් රථ 121 ක් දැනට අළුත්වැඩියා නොකර අවුරුදු 01 සිට 11 දක්වා කාලයක් වාහන අංගනයේ නවතා තිබුණි. | කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශ අනුව වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුදුකුඩියිරුප්පු ගොවිජන සේවා කාරක සභා මධ්‍යස්ථානය විසින් ප්‍රයෝජනයට ගනු ලැබූ රු. 11,722,959 ක් වටිනා අයිතම 09 ක ජංගම නොවන වත්කම් මධ්‍යස්ථානයේ නමට පවරා ගෙන නොතිබුණි. | නිසි පරිදි පවරා ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කරනු ලැබේ. | පවරාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තුනුක්කායි ගොවිජන සේවා කාරක සභාවේ 2021 වර්ෂයේ කොල්ලන්කුලම අමුණ ප්‍රතිසංස්කරණය කිරීම සහ බෝක්කු ඉදිකිරීම් සඳහා එකතුව රු. මිලියන 5.65 ක් වැයකර වැඩ නිමකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | වැව් අමුණ ප්‍රතිසංස්කරණයේදී වැවෙහි ජල පෝෂක ප්‍රදේශයේ පැවති රොන්මඩ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023.11.15 දිනට ප්‍රථම ඉවත් කරන ලෙස දැනුවත් කර කොන්ත්‍රාත් ගොවි සංවිධානය වෙත දැනුම් දී ඇත. | නියමිත පරිදි රොන්මඩ ඉවත් කර ජල සම්පාදනය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) | රු. මිලියන 2.01 ක මුදලක් වැයකර වැව් අමුණු ප්‍රතිසංස්කරණය සඳහා යොදාගත් පස් පිළිබඳ තත්ත්ව පරීක්ෂාවක් සිදු නොකිරීම සහ පස් සම්පීඩන ප්‍රමාණය නිසි ප්‍රමාණයෙන් සිදු නොකිරීම නිසා ඉරිතැලීම් සිදුවී තිබුණි. | ස්ථාන හයක පැවති ඉරිතැලීම් නැවත සකස් කරන ලෙස අංක 281/13/02/10/103 සහ 2023.01.10 දිනැති ලිපිය මගින් මා විසින් දැනුවත් කිරීම නිසා අදාල අළුත්වැඩියා සිදු කරමින් පවතී. | අඩුපාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (iii) | වැව සඳහා එකතුව රු. මිලියන 1.23 ක් වැය කර - බෝක්කු දෙකක් ඉදිකර තිබුණද, වැවේ ජලය පිට කිරීමට අවශ්‍ය ඇල මාර්ග සකස්කර නොතිබීමෙන් අක්කර 15 ක කුඹුරු ඉඩම් සඳහා ජල බෙදාහැරීමට බාධා සිදුවී තිබුණි. | කටයුතු කරනු ලැබේ. | ජලය පිට කිරීමේ ඇල මාර්ගය ප්‍රතිසංස්කරනය කර ජලය බෙදා හැරීම නිසිපරිදි සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පුදුකුඩියිරුප්පු ගොවිජන සේවා කාරක සභාවේ 2021 වර්ෂයේ ජල ටැංකිය ඉදි කිරීම ජල මෝටරය මිලදී ගැනීම සහ විදුලි සම්බන්ධතා ලබා ගැනීම යන කාර්ය සඳහා එකතුව රු. 925,944 ක් වැය කර, මාස 18 ක් පමණ ගතවී ඇතත් විදුලි සම්බන්ධතා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මිලදී ගෙන තිබූ ජල මෝටරය භෞතික පරීක්ෂණය සඳහාද ඉදිරිපත් කර නොතිබුණි. | ජල මෝටරය සවි කිරීම සඳහා විදුලි සම්බන්ධතා ලබා ගෙන කඩිනමින් සවිකරන ලෙස ගොවිජන සංවිධාන සහ ගොවිජන සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇත. | විදුලි සම්බන්ධතාවයන් ලබා ගෙන වතුර මෝටරය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ඔඩ්ඩුසුට්ටාන් ගොවිජන සේවා කාරක සභාවේ ONUR ව්‍යාපෘතියේ මුදල් ආධාර යටතේ එකතුව රු. 5,981,378 ක් වැය කර 2018 සහ 2019 වර්ෂවලදී පුද්ගලික ආයතනයක් විසින් සිදු කර තිබුණු කරුවේප්පමුරිප්පු වැව් අමුණු සහ එයට අදාල පිටවාන් ඉදි කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) මෙම වැව සඳහා රු. 1,000,215 ක් වැය කර බෝක්කු දෙකක් සහ කොංක්‍රීට් ඇල මාර්ග සකස් කර තිබුණද, මෙම ඇල මාර්ගයෙන් අක්කර 41 ක් ප්‍රමාණයක ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වසර 04 ක් ගතවී ඇතත්, ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් අවශ්‍ය කටයුතු නොකිරීම නිසා ඇල මාර්ගය කැලේ වැවී නිශ්ඵලව තිබුණි. | අදාල ප්‍රදේශයේ එම ඇල මාර්ග ප්‍රයෝජනයට ගෙන අක්කර 196 ක් මහ කන්නයේදි සහ අක්කර 25 යල කන්නයේදි වගා කර තිබුණි. | ජල මාර්ගය ප්‍රතිසංස්කරනය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) මෙම වැව් සඳහා ජලය ලබා ගන්නා මාර්ගයේ බාහිර පාර්ශවයන්ගෙන් බාධාවන් සිදුකර තිබීමෙන් ඉතා අඩු ප්‍රමාණයක ජලය ද පමණක් වී වගාව සඳහා ලබා දීමට හැකි වීමෙන් වැව ප්‍රතිසංස්කරන කර තිබුණද, අක්කර 41 ක ඉඩම් ප්‍රමාණයේ යල කන්නෙහි වගා කර නොතිබුණි. | ජලය බෙදාහැරීම විධිමත් කිරීමට කටයුතු කරනු ලැබේ. | බාධාවන් ඉවත් කර ජලය බෙදා හැරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක 2020 ජනවාරි 01 දිනැති 02/2020 අංක දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල්ගේ 1981 ඔක්තොම්බර් 16 වන දිනැති අංක 107 දරණ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව 01 සිට 16 දක්වා වන අදායම් නිසිපරිදි හඳුනාගෙන ඇස්තමේන්තුකර සමාලෝචිත වර්ෂයේ අදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි අයවැය ලේඛනය නිසිපරිදි පිළියෙල කරනු ලැබේ. | වාර්ෂික බලාපොරත්තු වන ආදායම් ඇතුලත් කර අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 06 ක තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා මධ්‍යස්ථානවලින් වාර්ෂිකව ක්‍රියාකළ යුතු ඉලක්ක සහ එම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සහ එහි ප්‍රගතිය මැනීමට අවශ්‍ය දර්ශක වර්ෂ 05 ක කාල සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂිකව ප්‍රගතිය මැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදි කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක වර්ෂ 2012 වර්ෂය සිට 2021 වර්ෂය දක්වා නිකුත් කළ තිබූ ගොවින් 75 දෙනෙකුගේ අයකර ගත යුතු වගා ණය එකතුව රු. 1,263,582 ක් සහ දඩ පොලි රු. 15,194 ක් අයකර ගැනීමට වර්ෂ 02 සිට 08 දක්වා කටයුතු කර නොතිබුණි. | කටයුතු කරමින් පවතී. | හිඟ වගා ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |